// ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

අති විශෙෂ

අංක 2298/49 - 2022 සැප්තැම්බර් මස 22 වැනි බ්‍රහස්පතින්දා - 2022.09.22

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

### ආදාහනාගාර අතුරු ව්‍යවස්ථාව සංශෝධනය

රත්තොට ප්‍රාදේශීය සභාව

**නිවේදනය**

අංක 1685/27 දරන 2010.12.24 වැනි දින ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අතිවිශෙෂ *ගැසට් පත්‍රයේ* පළ කරන ලද රත්තොට ප්‍රාදේශීය සභාවේ ආදාහනාගාරය පිළිබඳ අතුරු ව්‍යස්ථාවේ අංක 06 දරන වගන්තිය යටතේ "මෙම ගාස්තු සභාවේ සහා සම්මුතියක් මගින් වරින් වර සංශෝධනය කළ හැකි බවත් එකී ගාස්තු *ගැසට් පත්‍රයේ* පළ කළ යුතු බවත් එම ගාස්තු සභා කාර්යාලයේ සහ ආදාහනාගාරයේ ප්‍රදර්ශනය කළ යුතු ය." යන උප වගන්තිය 2022.07.15 වැනි දින පැවති මහ සභාවේ තීරණ අංක 5:I (iv) යටතේ සංශෝධනය වන බව මෙයින් නිවේදනය කරනු ලැබේ.

**යූ. පී. තෙන්නකෝන් කුමාරසේන,**
සභාපති
ප්‍රාදේශීය සභාව,
රත්තොට.

2022 අගෝස්තු මස 29 වැනි දින,
කොළඹ දී ය.

**තීරණය**

අංක 1685/27 දරන 2010.12.24 වැනි දින ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *අතිවිශෙෂ ගැසට් පත්‍රයේ* පළ කරන ලද රත්තොට ප්‍රාදේශීය සභාවේ ආදාහනාගාරය පිළිබඳ අතුරු ව්‍යවස්ථාවේ අංක 06 දරන වගන්තිය ප්‍රකාරව, 2022.07.15 වැනි දින මහ සභාවේ තීරණ අංක 5:I (iv) යටතේ රත්තොට ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ මෘත ශරීරයක් ආදාහනය කිරීම සඳහා රු. 20,000/- ක මුදලක් සහ රත්තොට ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයෙන් පිටත ආදාහනයක් සිදු කිරීම සඳහා රු. 30,000/- ක මුදලක් අය කිරීමටත් මෘත ශරීරයක් ආදාහනය කිරීම සඳහා ආදාහනාගාර ගාස්තු ලෙස මෙම ගාස්තු ප්‍රාදේශීය සභාවේ සහා සම්මුතියක් මගින් වරින් වර සංශෝධනය කළ හැකි බව ද තීරණය විය. ඒ අනුව ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *අතිවිශෙෂ ගැසට් පත්‍රයේ* පළ කරනු ලබන දින සිට රත්තොට ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ ඉහත ගාස්තු අය කිරීමට තීරණය කරමි.

EOG 09 - 0244

1A - PG 5979 — 07 (2022/09)
ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.
*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*